**2022 ජුනි මස 17 දින පැවති යටිතල පහසුකම්,නිවාස,පුස්තකාල,තොරතුරු තාක්ෂණ හා පුහුණු පිළිබඳ ස්ථාවර කමිටුවේ ගන්නා ලද තීරණ මුදල් ස්ථාවර කමිටුව**

**කමිටු සාමාජිකයන්**

1. ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී.විමුක්ති රණවීර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති
2. ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
3. කේ.පි.සචිනි නිමේෂා මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
4. ජී.ඒ.ශිවන්ත මලික් කුමාර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
5. එම්.එස්.එම්.අල් ෆාරිස් මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
6. ජී.බී.නුවන් චතුරංග මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

**නොපැමිණීම**

1. කේ.පි.සචිනි නිමේෂා මැතිතුමිය - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
2. ජී.ඒ.ශිවන්ත මලික් කුමාර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
3. එම්.එස්.එම්.අල් ෆාරිස් මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

**නිලධාරි**

1. ජයනි රාජකරුණා මිය - නාගරික ගණකාධිකාරි
2. කේ.ජී.එන්.සී.බණ්ඩාර මහතා - නාගරික ඉංජිනේරු
3. එන්.පී.කේ.රණසිංහ මිය - පරිපාලන නිලධාරි
4. කේ.පී.අයි.සමතපාල මිය - පුස්තකාලයාධිපති
5. එන්.පී.කුරුනේරු මහතා - මහජන සෞඛ්‍ය පරික්ෂක
6. ටී.එල්.එස්.පිරිස් මිය - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි(මුදල්)
7. පද්මා සෙනෙවිරත්න මිය - සැළසුම් අංශ ප්‍රධානි
8. ඩබ්.ඒ.ටී.එම්.වික්‍රමසිංහ මිය - පරිගණක පුහුණු උපදේශක (වැ.බ.)
9. ජේ.බී.මධුෂා ගයත්‍රී මෙනවිය - විෂය ලිපිකරු

**නිලධාරි නොපැමිණීම**

1. ජයනි රාජකරුණා මිය - නාගරික ගණකාධිකාරි

1. නගර සභා බල ප්‍රදේශයේ වෙසෙන ජනතාව විසින් සභාවේ අනුමැතියකින් තොරව කරනු ලබන ඉදිකිරීම් නිසා පොදු මහජනතාවට බාධාවක්ව පවතියි. එවන් ඉදිකිරීම් කර ඇති පුද්ලගයන් දැනුවත් කර අවවාද කිරිම සඳහා ආදායම් අංශයේ ක්ෂෙත්‍ර පරික්ෂක නිලධාරි සහ ආදායම් පරික්ෂක නිලධාරි දැනුවත් කිරිමට තීරණය කරන ලදි.

2. මහජන පුස්තකාලයාධිපති විසින් නගර සභා මුද්‍රණාය පිටුපස මහජන පුස්තකාල භූමිය තුල කැළි කසල ගොඩගසා පුළුස්සන බැවින්, එම කැළි කසල කඩිනමින් ඉවත් කර දෙන ලෙස කල ඉල්ලීම. එම කැළි කසල කඩිනමින් ඉවත් කිරීම සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙත වගකිම පැවරීමට තීරණය විය.

3. නගර සභා පරිශ්‍රය තුල භාහිර පුද්ගලයන් හා උපකාර පන්තිවලට එන දරු දැරියන්ගේ යම් යම් අගතිගාමී කටයුතු සිදුවන බවට කමිටුවට පැමිණිලි ලැබී ඇත. එබැවින් එවැනි පුද්ගලයන් ඇතුල්වීමේදී විමසා බැලීම සඳහා ආරක්ෂක අංශයේ සියළු දෙනා දැනුවත් කිරීම සඳහා ගරු නගරාධිපතිතුමා සහ නාගරික කොමසාරිස්තුමාගේ ප්‍රධානත්වයෙන් යුතු කඩිනම් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට තීරණය කරන ලදි. (වගකිම - නාගරික ඉංජිනේරු)

## <u>මුදල් ස්ථාවර කමිටු නිර්දේශයන් සඳහා</u>

1. පුස්තකාලයාධිපතිනිය විසින් ලිපියක් යොමු කරමින් ජාතික කියවීමේ මාසය - 2022 යටතේ "දැනුමැති සමාජයක් උදෙසා කියවීම" තේමාවට සමගාමීව මහජන පුස්තකාලයේ ළමා අංශය මගින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩසටහනේ ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම.
   මෙම ඉල්ලීම කමිටුව අනුමත කරන ලදි. මේ සඳහා වියදම් පියවා ගැනීමට රු.50,000.00 ක් කමිටු ප්‍රතිපාදන මගින් ලබාදීමට තීරණය කරන ලදි.

2. මහජන පුස්තකාලයට පැමිණෙන අබාධිත පුද්ගලයන් වෙනුවෙන් ආබාධිත පිවිසුමක් සකස් කිරීමට කල යෝජනාව අනුමැතියට යොමු කිරීම.

3. නගර සභා බල ප්‍රදේශයේ ඇති නාම පුවරු රහිත මාර්ග සඳහා නාම පුවරු සකස් කිරීමට එක් කොට්ඨාශයක් සඳහා රු.75,000.00 ක මුදලක් කමිටු ප්‍රතිපාදන යටතේ වෙන් කිරීමට ගත් තීරණය අනුමැතියට යොමු කිරීම.

   I. නාගරික මන්ත්‍රී ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් 254 තුලාන සමන්පුර කොට්ඨාශයේ මාර්ගවල නාමය ප්‍රදර්ශනය කිරීම සඳහා පුවරු සකස් කර සවිකිරීම සඳහා රු.75,000.00 ක මුදල ලබා දෙන ලෙස ඉල්ලීම.

4. සෑම කොට්ඨාශයකම පවතින අත්‍යාවශ්‍ය කාණු පද්ධති පිළිසකර කර දීම සඳහා සංවර්ධන කාර්ය උපරිම රු.50,000.00 ක යටත්ව සිදු කිරීමට සෑම කොට්ඨාශයකින්ම යෝජනා අනුමැතියට යොමු කිරීම.

I. ගරු නගරාධිපතිතුමා විසින් 240 තම්මැන්නාකුලම කොට්ඨාශය සඳහා අඩි 02 විශ්කම්භය ඇති බෝක්කු 04 ක් ලබා දෙන ලෙස ඉල්ලීම් කිරිම.

II. සුරංගි ආර් සමරතුංග මැතිතුමිය විසින් 248 අභය පෙදෙස කොට්ඨාශයේ දුම්රිය නිවාස පිටුපස කාණු පද්ධතිය හා ධර්මපාල මාවත කාණු පද්ධතිය කපා දෙන ලෙස ඉල්ලීම් කිරිම.

III. එම්.පි.එම්.අන්සාර් මැතිතුමා විසින් 252/249 ජයන්ති පෙදෙස කොට්ඨාශය සඳහා අඩි 02 විශ්කම්භය සහිත බෝක්කු ලබා දෙන ලෙස ඉල්ලිම කිරිම.

IV. එල්.පී.ප්‍රේමචන්ද්‍ර මැතිතුමා විසින් 319 බණ්ඩාරපුලියන්කුලම අතුරු මාර්ගයට යෙදිම සඳහා අවශ්‍ය අඩි 1 ½ බෝක්කු බට 03 ක් හා කොලර් 02 ක් ලබා දෙන ලෙස ඉල්ලිම.

V. නදිර ප්‍රභාත් ධර්මදාස මැතිතුමා විසින් අංක 05 ඉසුරුමුණිය කොට්ඨාශයේ ජලය බැස යාම සඳහා අඩි 1 ½ විශ්කම්භයෙන් යුත් අඩි 08 දිග බෝක්කු 03 ක් ලබා දෙන ලෙස ඉල්ලිම.

VI. විරාජ් රණවිර මැතිතුමා විසින් පහත සඳහන් ස්ථාන සඳහා අවශ්‍ය බෝක්කු කැට ලබා දෙන ලෙස ඉල්ලීම.

- නිදහස් මාවත VIII වන පටුමග 4’x2’ බෝක්කු කැට 04
- නිදහස් මාවත අභය පටුමග 4’x2’ බෝක්කු කැට 03
- නිදහස් මාවත සහ යසපාල හේරත් මාවත සම්බන්ධ වන මාර්ගයේ ප්‍රවේශ බෝක්කුව සඳහා 4’x2’ බෝක්කු කැට 02 හා කොලර් 01

ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී.විමුක්ති රණවිර,
නාගරික මන්ත්‍රී /කමිටු සභාපති,
යටිතල පහසුකම්, නිවාස, පුස්තකාල තොරතුරු තාක්ෂණ හා
පුහුණු කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව,
මහා නගර සභාව,
අනුරාධපුර.